www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසප ආරම්භක සමුලුවේ ලියවිලි: මූලධර්ම පිලිබඳ ප්‍රකාශය -- 1 වන කොටස

## Documents of the SEP Founding Congress: Statement of Principles—Part 1

**2008 සැප්තැම්බර් 25**

*සමාජවාදී සමානතා පක්ෂය (එක්සත් ජනපදය), සසප මූලධර්ම පිලිබඳ ප්‍රකාශයේ පලමු වන කොටසින් ආරම්භ කරමින්, සිය ආරම්භක සමුලුවේ ලියවිලි පල කිරීම අදින් අරඹයි. මූලධර්ම පිලිබඳ ප්‍රකාශය, 2008 අගෝස්තු 3-9 දිනවල පැවති සම්මේලනය විසින් ඒකමතිකව සම්මත කරන ලදි.*

### සමාජවාදී සමානතා පක්ෂයේ ජාත්‍යන්තර කර්තව්‍යයෝ

1. සමාජවාදී සමානතා පක්ෂය (සසප), 1938 දී ලියොන් ට්‍රොට්ස්කි විසින් පිහිටුවන ලද හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවෙහි දේශපාලන අධිකාරය පිලිගනිමින්, එය සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. සසපයේ මූලධර්ම තුලට, 20 වන සියවසේ අත්‍යවශ්‍ය විප්ලවකාරී නැගිටීම් හා ඊට අනුරූපව ලෝක සමාජවාදී විප්ලවයේ ක්‍රියාමාර්ගය සඳහා මාක්ස්වාදීන් ගෙනගිය අරගලය, අන්තර්ගතව තිබේ. සවිඥානක දේශපාලන අරගලය තුලට මහජනතාවගේ බලහත්කාරී ඇතුල් වීම සලකුනු කරන සමාජවාදී විප්ලවය, ලෝක ඉතිහාසය තුල මිනිසාගේ සමාජ සංවිධානයේ ආකෘතිය, පන්ති මත පදනම් වීම නිසා, මානව වර්ගයා විසින් ම මානව වර්ගයා සූරාකෑමේ සමාජයෙහි අවසානය සලකුනු කරන, ශ්‍රේෂ්ඨතම හා වඩාත්ම ප්‍රගතිශීලී පරිවර්තනය පිලිබඳ පෙර නිමිත්තකි. ඒ සා දැවැන්ත වූ පරිවර්තනයක් සමස්ත ඓතිහාසික යුගයක ම අරගලයකි. පලවන ලෝක යුද්ධය පුපුරා යාමත් ඉන් කෙටි කලකට පසුව 1917 ඔක්තෝබර් විප්ලවය තුල රුසියානු කම්කරු පන්තිය විසින් රාජ්‍ය බලය අල්ලා ගැනීමෙන් ආරම්භ වන මෙම යුගයේ අත්‍යවශ්‍ය අත්දැකීම් සැලකිල්ලට ගැනීමෙන්, සසපයේ මූලධර්ම උකහාගෙන තිබේ.

2. සසප සහයෝගීතාවය පවත්වන හතරවන ජාත්‍යන්තරය, නැගී ආවේ, ස්ටැලින් හා ඔහුගේ හෙන්චයියන් විසින් නායකත්වය දුන් ආඥාදායක තන්ත්‍රය, ලෝක සමාජවාදී විප්ලවයේ ක්‍රියාමාර්ගය පාවාදීමට හා සෝවියට් සංගමයේ නිලධාරිවාදී පරිහානියට එරෙහිව ලියොන් ට්‍රොට්ස්කි විසින් නායකත්වය දුන්, මාක්ස්වාදී ජාත්‍යන්තරවාදීන් ගෙන ගිය නිර්දය අරගලය තුලිනි. 1991 දී අවසාන වශයෙන් සෝවියට් සංගමය විසුරුවා හැරීමට තුඩුදුන් එම පාවාදීමේ දේශපාලන මූලය, ස්ටැලින්වාදී තන්ත්‍රය විසින් ජාත්‍යන්තරවාදය සඳහා ජාතිකවාදය ආදේශ කිරීමයි.

3. සමාජවාදී විප්ලවය ජාත්‍යන්තර විෂය පරිමාවකින් යුක්තය. ට්‍රොට්ස්කි ලිවූ පරිදි "සමාජවාදී විප්ලවය ජාතික කරලියේ ආරම්භ වී, ජාත්‍යන්තර කරලියෙහි විකසිත වී, ලෝක කරලියෙහි පරිපූර්නත්වයට පත් වෙයි. එබැවින් සමාජවාදී විප්ලවය, ලෝකයේ නව හා පෘථුල අර්ථයකින් නොනවතින විප්ලවයක් වෙයි. එය පරිපූර්නත්වය අත් කර ගන්නේ අපගේ සමස්ත පෘතුවි ගෝලයම මත නව සමාජයේ අවසන් ජයග්‍රහනයෙන් පමනි.'' හතරවන ජාත්‍යන්තරයේ මෙම ප්‍රමුඛ මූලධර්මය, සසප ක්‍රියාමාර්ගය හා අනන්‍යතාව අංගලක්ෂනය කරයි. මෙය පන්නර ගැන්වුනේ ස්ටැලින්වාදී ''තනි රටේ සමාජවාදය පිලිබඳ න්‍යාය'' ට එරෙහි අරගලය තුල ය. අනෙක් සෑම රටක දී මෙන්ම එක්සත් ජනපදය තුලත්, කම්කරු පන්තියේ මූලෝපාය වර්ධනය කල යුත්තේ ලෝක තත්වය පිලිබඳ විශ්ලේෂනයකිනි. ජාතික ක්‍රියාමාර්ගයන්ගේ අවධිය, ප්‍රථම ලෝක සංග්‍රාමය පැන නැගීමත් සමඟ අවසන් විය. සිය වසකට ආසන්න කාලයකින් පසුව, ලෝක ආර්ථිකයේ දැවැන්ත වර්ධනයකට හා එහි ගෝලීය ඒකාග්‍රකරනයට මඟ පෑදූ ලෝක ආර්ථික තත්වයේ හා නොවැලැක්විය හැකි අන්තර්-අධිරාජ්‍යවාදී හා අන්තර්-ධනවාදී එදිරිවාදිකම්, ජාතික දිවියේ ප්‍රධාන තීරකවරුන් බවට පත්ව ඇත. එබැවින් ට්‍රොට්ස්කි පැහැදිලි කල පරිදි, "කම්කරු පන්තියේ ජාතික දිශානතිය ගලා ආ යුත්තේ ද ගලා ආ හැක්කේ ද ලෝක දිශානතියකින් මිස එහි අනෙක් පැත්තට නොවේ."

4. කම්කරු පන්තියේ විප්ලවවාදී අරගල ප්‍රථමයෙන් පැන නගින්නේ උතුරු ඇමරිකාවේ, දකුනු ඇමරිකාවේ, යුරෝපයේ, ආසියාවේ, අප්‍රිකාවේ හෝ ඕස්ට්‍රේලියාවේ දියුනු හෝ අඩු දියුනු රටක වේවා, සමාජ කලබැගෑනිය අනිවාර්යයෙන්ම ගෝලීය පරිමාවක් අත් කර ගනු ඇත. සමාජවාදී විප්ලවය ජාතික ආකෘතියක් තුල සම්පූර්න කල නොහැකි හා නොවනු ඇත. ට්‍රොට්ස්කි සිය නොනවතින විප්ලවයේ න්‍යාය තුල පෙර දුටු ආකාරයට එය පරිපූර්න වන්නේ ලෝක කරලියකය.

5. නූතන ධනේශ්වර සමාජයේ ප්‍රධාන හා තීරනාත්මක ජාත්‍යන්තර විප්ලවවාදී සමාජ බලවේගය වන කම්කරු පන්තියේ අවශ්‍යතාවන්, සමාජවාදී සමානතා පක්ෂයේ ක්‍රියාමාර්ගය තුල ප්‍රකාශයට පත් කරයි. සසපයේ මූලික කර්තව්‍ය වන්නේ ජාත්‍යන්තර සමාජවාදයේ ක්‍රියාමාර්ගය සඳහා ඇමරිකානු කම්කරුවන්ගේ සහාය දිනාගැනීමයි. මෙම ක්‍රියාමාර්ගය මත පදනම් වන සසප, එක්සත් ජනපදය තුල දේශපාලන බලය අල්ලාගෙන, කම්කරු රාජ්‍යයක් ගොඩනැගීම සඳහා කම්කරු පන්තිය ඒකාබද්ධ කර මෙහෙයවීමට සටන් වදිනු ඇත. අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී, සමනාත්මතා හා සමාජවාදී සමාජයක් ගොඩනැගීම සඳහා වෛෂයික පූර්ව කොන්දේසි මේ මගින් නිර්මානය කරනු ඇත. මෙම අරමුනු සාක්ෂාත් කල හැක්කේ, සියලු රටවල කම්කරුවන්ගේ ගෝලීය එකමුතුව හා එක්සත් සමාජවාදී රාජ්‍යයන්ගේ ලෝකයක් නිර්මානය කිරීම අරමුනු කර ගත් ජාත්‍යන්තර මූලෝපායක ආකෘතිය තුල පමනි.

## ධනවාදයේ අර්බුදය

6. ධනවාදය හා අධිරාජ්‍යවාදී පද්ධතිය සිය වර්ධනය අත් කර ගත් ආර්ථික පදනම්, නූතන ලෝකයේ මානව දරිද්‍රතාවය, සූරාකෑම, ප්‍රචන්ඩත්වය හා වද වේදනා වල ප්‍රමුඛ හේතුවයි. සමාජ-ආර්ථික සංවිධානයේ පදනමක් ලෙස ධනවාදය, දිගු කලකට පෙර සිටම සිය ඓතිහාසිකව ප්‍රගතිශීලී ක්‍රියාකලාපය අවසන් කර ඇත. 20 වන සියවසේ ලේ වැකි ඉතිහාසය - ලෝක යුද්ධ දෙකක් ද, නිමක් නැති ''ප්‍රාදේශීය'' ගැටුම්, නාසිවාදයේ භීෂනය හා විවිධ වර්ගයේ මිලිටරි-පොලිස් ආඥාදායකත්වයන්, ජන ඝාතන හා වාර්ගික ගැටුම් - ධනේශ්වර ක්‍රමයට එරෙහි කට උත්තර නැති චෝදනාවති. ධනවාදය උසිගන්වා ඇති ප්‍රචන්ඩත්වයේ ගොදුරු බවට පත් වූවන් මිලියන සිය ගනනකි. මෙම සංඛ්‍යාවට, මුලු මහත් මහාද්වීපයන්හි ම , එහි සියලු දුක් වේදනා සහිතව දුගී භාවයේ ගිල්වා දැමූවන් ඇතුලත් නොවේ.

7. පවත්නා නිෂ්පාදන බලවේගයන්ගේ යෝධ පරිමාව හා තාක්ෂනයේ අසාමාන්‍ය නව සොයා ගැනීම්, දුගී භාවය තුරන් කිරීමට පමනක් නොව ග්‍රහ ලෝකයේ සිටින සෑම මිනිසෙකුට ම ඉහල ජීවන තත්වයක් සහතික කිරීමට ඕනෑවටත් වඩා සෑහෙන්නේය. පෙර නොවූ විරූ ද්‍රව්‍යමය සම්පත් හමුවේ සංස්කෘතිය මල් පල ගැන්විය යුතු වුවත්, කම්කරු පන්තියේ ජීවන තත්වයන් එන්ට එන්ටම ප්‍රපාතයට ගමන් කරයි. අනාගත බලාපොරොත්තුවක් හා ඉදිරිදර්ශනයක් නොමැති කමෙන් පීඩාවට පත් සංස්කෘතිය, ගැඹුරු අර්බුදයක කිඳ බැස තිබේ. පවත්නේ කුමක් ද හා පැවතිය යුත්තේ කුමක් ද යන විසංවාදයේ මූලය ඇත්තේ, නිෂ්පාදන මාධ්‍යයන්ගේ පුද්ගල අයිතිය මත පදනම් වූ ගෝලීය ආර්ථික පද්ධතියක් හා ලෝකය පස මිතුරු ජාතික රාජ්‍යයන්ට බෙදී පැවතීම තුලය.

8. වැඩ කරන ජනතාවගේ ජීවන තත්වයන් උසස් කිරීමට හා බැරෑරුම් ගැටලු විසඳීමට දරන ඕනෑම ප්‍රයත්නයක්, නිෂ්පාදනයේ පුද්ගලික හිමිකාරත්වයේ, ධනේශ්වර වෙලඳපොලේ අරාජකත්වයේ, ලාභ පද්ධතියේ ආර්ථික අනසකෙහි හා අවසාන වශයෙන් එහෙත් වැදගත්කම අතින් නොදෙවෙනි, පාලක පන්තියේම අතෘප්තිකර කෑදර කම හා මුදල් උමතුවේ බාධකයට එරෙහිව පිහිටයි. ධනේශ්වර වෙලඳපොල සම්පත් බෙදාහැරීමේ හා සමාජ අවශ්‍යතාවන් පිලිබඳ සුපිරි ඥානවන්ත බේරුම්කරුවාය යන කියා පෑම, පසුගිය දශකය තුල ලෝක ආර්ථික පද්ධතිය දෙදරුම් කෑවූ බිලියන සංඛ්‍යාත බංකොලොත්වීම් හා නිමක් නැති සමපේක්ෂන සෝලි හමුවේ තරයේ ම අපකීර්තියට පත්ව තිබේ. ''නීත්‍යානුකූල'' හා, සාපරාධී ලෙස වංචනික මූල්‍ය ගනුදෙනු අතර සීමා මායිම් කිසිසේත් හඳුනාගත නොහැකි තරමට ම පටුවී තිබේ. නිෂ්පාදනයෙන් හා සැබෑ වටිනාකම් නිර්මානය කිරීමේ ක්‍රියාවලියෙන්, පුද්ගල ධන ඒකරාශීකරන ක්‍රියාවලිය වෙන්කොට ගැනීම, ධනේශ්වර පද්ධතියේ පොදු කුනුවීමේ ප්‍රකාශනයකි.

9. ශාස්ත්‍රීය අර්ථයකින් ගත් කල, ලාභ පද්ධතිය හා මනුෂ්‍යත්වයේ ම පැවැත්ම අතර නොවැලැක්විය හැකි ගැටුමේ අතිශය හානිකර ප්‍රකාශනය අත්කර ගන්නේ, ගෝලීය උනුසුම්වීම හා ස්වාභාවික පරිසරය පිලිබඳ අර්බුදය තුලය. මෙහි හේතුව රඳ ඇත්තේ මනුෂ්‍ය ශිෂ්ඨාචාරයේ දියුනුවට තීරනාත්මක වන, විද්‍යාවේ හා තාක්ෂනයේ සංවර්ධනයෙහි නොව, අතාත්වික හා යල් පිනූ ආර්ථික පර්යායක් මගින් ඒවා අවභාවිතා කිරීම තුලය. ලාභ පද්ධතියේ ආකෘතිය තුල, දේශගුනික විපර්යාස හා අනෙකුත් පාරිසරික ගැටලු පිලිබඳ එන්ට එන්ටම බරපතල වන දුෂ්කරතාවන්ට අව්‍යාජ විසඳුමක් සොයාගත නොහැකිවීමේ කරනය, පරිසරය පිලිබඳ උත්සුකයන් පලකරන දේශපාලඥයන්ට පමනක් නොව, පොදුවේ සියලු ධනේශ්වර දේශපාලඥයන්ට ද ඉවත නොදැමිය හැකි ''සුව පහසු ගෙන නොදෙන සත්‍යයක්'' වී තිබේ. සියලු විද්‍යාත්මක සාක්ෂි පෙන්නුම් කරන්නේ, ග්‍රහලෝක පරිසරය, ලාභාපේක්ෂාව හෝ විනාශකාරී ජාතික අවශ්‍යතාවන් වෙනුවෙන් තව දුරටත් ප්‍රාන ඇපකරුවන් කර නොගන්නාවූ, ලෝක ආර්ථිකයේ සමාජවාදී ප්‍රතිසංවිධානයකින් මෙහාපැත්තේ නම්, ව්‍යසනයක් වැලැක්වීමට නැතුව ම බැරි හරිතාගාර වායූන් අවම කිරීම, සිදුකල නොහැකිය යන කාරනයයි.

10. පැතිර යන ආර්ථික අර්බුදයටත් වැඩ කරන ජනතාවගේ සමාජ තත්වයන්හි පිරිහීමටත් විසඳුම ඇත්තේ, ධනවාදය ප්‍රතිසංස්කරනය කිරීම තුල නො වේ. එය තව දුරටත් ප්‍රතිසංස්කරනය කල නොහැක්කකි. අර්බුදය පද්ධතිමය හා ඓතිහාසික ස්වභාවයක් ගෙන

තිබේ. වැඩවසම්වාදය ධනවාදයට මඟ හෙලිකලා සේම, ධනවාදය සමාජවාදයට ඉඩ හල යුතුය. ප්‍රධාන කාර්මික, මූල්‍ය, තාක්ෂනික හා ස්වාභාවික සම්පත් ධනේශ්වර වෙලඳපොලේ හා පුද්ගලික හිමිකමේ ග්‍රහනයෙන් මුදා ගෙන සමාජය අතට පත් කරමින්, කම්කරු පන්තියේ සුපරීක්ෂාකාරිත්වය හා පාලනය යටතේ තැබිය යුතුය. වටිනාකම පිලිබඳ නීතියේ පදනම මත ආර්ථික ජීවිතය සංවිධානය කිරීම, සමාජ අවශ්‍යතාවන් සපුරාලීමේ අරමුන සහිත වූ ප්‍රජාතන්ත්‍රීය ආර්ථික සැලසුම් කරනයේ පදනම මත, එහි සමාජවාදී ප්‍රතිසංවිධානයකින් විස්ථාපනය කල යුතුය.

11. කර්මාන්තය හා මූල්‍යය අන්තර් ජාතික සංගත විසින් පාලනය කරන ආර්ථික පද්ධතිය, ගෝලීය පරිමානයක ක්‍රියාත්මක වන අතර ධනවාදය, ජාතික රාජ්‍ය පද්ධතියක් තුල මුල් බැසගෙන තිබේ. අවසාන විග්‍රහයේ දී ජාතික රාජ්‍යය, සෑම රටකම පාලක පන්තීන් සිය අවශ්‍යතාවන් ලෝක කරලිය මත ගෙන යාමේ දී එම කටයුතුවලට පදනමක් ලෙස සේවය කරයි. පලමු හා ප්‍රමුඛ වශයෙන් එක්සත් ජනපදය ද ඇතුලු, ප්‍රධාන අධිරාජ්‍යවාදී රටවල භූ-දේශපාලනික ආධිපත්‍යය, බලපෑම් කිරීමේ වැයික්කි, වෙලඳපොලවල්, තීරනාත්මක සම්පත් මත පාලනය හා ලාභ ශ්‍රමය වෙත පිවිසුම් සඳහා පවතින පාලනය කල නොහැකි තල්ලුව, අනිවාර්යයෙන්ම යොමුව ඇත්තේ යුද්ධයට ය. 1946 වසරේ නියුරම්බර්ග්හි යුද අපරාධ විනිශ්වයේ දී පිහිටුවන ලද නීතිමය පූර්වාදර්ශ උල්ලංඝනය කරමින්, 2002 දී බුෂ් පරිපාලනය විසින් හඳුන්වාදුන් ''නිවාරක යුද්ධයේ'' ධර්මතාව, ප්‍රතිපත්ති පිලිබඳ උපකරනයක් ලෙස නීති යුක්ත කිරීම මඟින්, නිමක් නැතිව පැතිර යන සාහසිකත්වයට වේදිකාව සකස් කලේය.

12. ඇමරිකානු සංගත හා මූල්‍ය ප්‍රභූව විසින්, සිය ගෝලීය අභිප්‍රායන් මුදුන්පත් කර ගැනීම සඳහා මිලිටරි ප්‍රචන්ඩත්වය යොදා ගැනීමට ප්‍රෝඩාකාරී නිමිත්තක් ලෙස උපයෝගී කර ගන්නා "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" සසප එක පැහැර හෙලාදකියි. එක්සත් ජනපදය තුල විජිතවාදී කෲරත්වයට එරෙහි අරගලයේ සම්භවයන් අමතක කරමින් ආන්ඩුව හා මාධ්‍ය, විදේශික හමුදාවන් විසින් සිය රට යටත්කර ගැනීමට විරෝධය පාන සියල්ලන් ''ත්‍රස්තවාදීන්'' ලෙස හංවඩු ගසති. අධිරාජ්‍යවාදීන් ගොතන ලද මෙම මඩගැසීම හෙලාදකින සසප, තමන් ද, තම නිවාස හා රටවල්, නව යටත්විජිතවාදී ආක්‍රමනිකයාගෙන් ආරක්ෂා කර ගැනීමෙහිලා ජනතාවට ඇති මූලික අයිතිය ආරක්ෂා කරයි. යටත් කර ගත් රටවල හෝ ලෝකයේ කොතැනක හෝ අහිංසක සිවිල් වැසියන් ඉලක්ක කර ගනිමින් සිදු කරන ප්‍රචන්ඩ ක්‍රියාවලට සසපයේ විරුද්ධත්වය, එම මූලධර්මාත්මක ආස්ථානය නිසා බිඳකුදු ලිහිල් නොවේ. ත්‍රස්තවාදී යයි නීත්‍යානුකූලව නිර්වචනය කල හැකි එවන් ක්‍රියා, දේශපාලනිකව ප්‍රතිගාමීය. අහිංසක සිවිල් වැසියන් ඝාතනය මහජනතාව කුපිත කර, අවමංගත කර ව්‍යාකූලත්වයේ හෙලයි. ඒවා යටත් කර ගත් රටෙහි නිකායික හා වාර්ගික බෙදීම් ගැඹුරු කරයි. එම සීමාවෙන් පිටත සිදු කරන එවන් ක්‍රියා මඟින් ත්‍රස්තවාදය, කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුව සඳහා අරගලයට වල කපන අතර, යුද්ධයට පැනීමේ නැඹුරුව යුක්ති සහගත හා නීත්‍යානුකූල කිරීමට එවන් අවස්ථා ඩැහැ ගැනීමට බලා සිටින එක්සත් ජනපද සංස්ථාපිතයේ කොටස්වලට උඩ ගෙඩි දීමක් වෙයි.

13. ඉරාකයෙන් හා ඇෆ්ගනිස්ථානයෙන් ඇමරිකානු හමුදා වහාම ඉවත් කල යුතු යයි සසප බලකර සිටින අතර, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ගෝලීය අවශ්‍යතාවන්ට බාධක ලෙස, ධවල මන්දිරය හා පෙන්ටගනය විසින් එක් හෝ තවත් හේතුවක් නිසා හඳුනාගෙන ඇති, ඉරානය හා තවත් රටවලට එරෙහි තර්ජන නතර කල යුතු බව කියා සිටියි. එක්සත් ජනපද මිලිටරිවාදයට හා එහි යුද සැලසුම්වලට එරෙහි පුලුල් මහජන විරෝධතාවන්ට සසප සහයෝගය දෙමින් දිරිමත් කරයි. යුද්ධයේ හේතු ලැගුම් ගෙන ඇත්තේ සමාජයේ ආර්ථික ව්‍යුහය තුලත්, ජාතික රාජ්‍ය ලෙස එහි බෙදීම තුලත් ය යන කාරනය සැලකිල්ලට ගන්නා කල, අධිරාජ්‍යවාදී මිලිටරිවාදයට හා යුද්ධයට එරෙහි අරගලය සාර්ථක විය හැක්කේ, ජාත්‍යන්තර විප්ලවවාදී මූලෝපායක හා ක්‍රියාමාර්ගයක පදනම මත කම්කරු පන්තිය මෙහෙයවන තාක් දුරට පමනකි.

## ධනේශ්වර රාජ්‍යය හා ප්‍රජාතන්ත්‍රවාදය

14. කම්කරු පන්තිය විසින් දේශපාලන බලය අල්ලා ගෙන කම්කරු රාජ්‍යයක් පිහිටු වීම, සමාජවාදී ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පූර්ව කොන්දේසියයි. බලය සඳහා අරගලයේදී තමන්ට හැකි සෑම ප්‍රජාතන්ත්‍රීය හා නීතිමය අයිතියක් ම කම්කරු පන්තිය විසින් ප්‍රයෝජනයට ගත යුතු අතර. පුලුල් ඓතිහාසික අත්දැකීම පෙන්නුම කර ඇත්තේ, පවත්නා ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී ආයතන හා ධනේශ්වර රාජ්‍යයේ ආකෘතිය තුල සමාජයේ සමාජවාදී ප්‍රති සංවිධානයක් කල නොහැකි බවයි. රාජ්‍ය පිලිබඳ සම්භාව්‍ය නිර්වචනය වන්නේ එය "හුදෙක් සන්නද්ධ මිනිසුන්ගෙන් පමනක් නොව අතිරේක ද්‍රව්‍යමය සම්පත්, බන්ධනාගාර හා සියලු වර්ගයේ බලහත්කාරය යොදාගන්නා ආයතනවලින් ද" සමන්විත පන්ති පාලනයේ උපකරනයක් යන්නය. (එංගල්ස්) එය සියවසකට පෙරදීට වඩා අදට සත්‍යයකි. රාජ්‍යය, සංශෝධනවාදීන් පුරද්දක් ලෙස කියන ආකාරයට, සමාජ ගැටුමේ මධ්‍යස්ථ බේරුම්කරුවෙකු නොවේ. එහි පැවැත්ම ම සාක්ෂ්‍ය දරන්නේ සමාජය එකට නොපෑහිය හැකි විසංවාදී පන්තීන්ට බෙදී ඇති බවට ය. ධනේශ්වර රාජ්‍ය වනාහි ධනපති පන්තියේ දේශපාලන ඒකාධිපතිත්වය දරන උපකරනයකි. නීතිය

පැත්තෙන් වුවත්. ශ්‍රේෂ්ඨාධිකරන විනිශ්චයකාර ඔලිවර් වෙන්ඩෙල් හෝම්ස් ගේ වචනවලින් ම ධනේශ්වරය, සිය මූලික පන්ති අවශ්‍යතාවන්ට "පැහැදිලි හා පවත්නා අන්තරායක්" ඉව වැටුනු විට මූලික ව්‍යවස්ථාමය අරක්ෂාවන් හා ක්‍රියාපටිපාටීන් පසෙකට පිසදා හැරීමේ අයිතිය තමන් වෙත තබා ගනියි.

15. එක්සත් ජනපදය ඇතුලත සිය පාලනය නීති යුක්ත කිරීම සඳහාත්, ලෝකය පුරා ප්‍රචන්ඩත්වය යොදාගැනීම යුක්ති සහගත කිරීම සඳහාත්, ප්‍රජාතන්ත්‍රවාදී කයිවාරු ඇදබාන අතර, සමකාලීන ඇමරිකානු රාජ්‍යය, අසාමාන්‍ය පරිමාවක හිංසනකාරී යාන්ත්‍රනයන් සිය ප්‍රයෝජනය සඳහා තැන්පත් කරගෙන සිටියි. විසි ලක්ෂයකට වැඩි මිනිසුන් සිරගත කොට තිබෙන බන්ධනාගාර පද්ධතිය ලොව විශාලතම එකය, උපරිමයෙන් සන්නද්ධ කල දැවැන්ත පොලිස් බලකායක්, මරන දන්ඩනය පැනවීමේ බලය ද සහිත, වාර්ෂිකව අත් අඩංගුවට ගන්නා මිලියන 14 කට වැඩි සංඛ්‍යාවක් පිලිබඳව කටයුතු කරන අධිකරන පද්ධතියක්, ඉමහත් ලෙස බලගතු හා අත දිගහැර අරමුදල් සැපයෙන, මිලිටරිමය හා ප්‍රජාතන්ත්‍ර විරෝධී මානසිකත්වයකින් පුහුනු කල මිලිටරි බලයක් හා ජනතාවගේ පුද්ගලික කටයුතුවලට ඇඟිලි ගැසීමේ හා ඔත්තු බැලීමේ අසාමාන්‍ය ඉඩ කඩ සලසා දී ඇති ජාතික ආරක්ෂක සංස්ථාවක් යනාදි වශයෙනි. මෙම සියලු සංස්ථාවන් මත ඇමරිකානු ජනතාවට කිසිදු අධීක්ෂනයක් හෝ පාලනයක් ඇත්තේ නැත. වධදීම් රාජ්‍ය ප්‍රතිපත්තිය බවට පත්ව තිබේ. හබෙයාස් කෝපුස් හිමිකම දැඩි ලෙස සීමා කර තිබේ. එක්සත් ජනපදය තුල පවත්වා ගෙන යන ප්‍රසිද්ධ බන්ධනාගාරවලට අමතරව රජය, ජාත්‍යන්තර වධකාගාර ජාලයක් රහසිගත බන්ධනාගාර මුවාවෙන් පවත්වාගෙන යමින් "සතුරු ප්‍රහාරකයන්" ලෙස හංවඩු ගැසූ නමක් නැති පුද්ගලයන් අතුරුදහන් කරයි.

16. පූර්ව ඓතිහාසික අවධියක දී ස්ථාපනය කල ප්‍රජාතන්ත්‍රීය අයිතීන් දැඩි බාදනයකට ලක්ව ඇත. " ජනතාවගේ, ජනතාව විසින්, ජනතාව සඳහා" යන ලින්කන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී දැක්ම දිගු කලක් තිස්සේ පරිහානිගතව ධනපතියන් සඳහා ධනපතියන් විසින් යන පාලනයකට මාරුවී තිබේ. සංගතවල පිටුබලය ලබන දේශපාලන පක්ෂ දෙකක් විසින් මැතිවරන ව්‍යාපාරයේ ඒකාධිකාරය සහතික කරන, ආයතනික ගත ද්වි පාර්ශවීය ''ද්වි පක්ෂ'' ක්‍රමයක් මඟින් සන්නද්ධ කරන ලද, දේශපාලන ක්‍රියාවලියක් තුල ඡන්ද අයිතියට ඇත්තේ සීමිත අර්ථයක් පමනි. පවත්නා මැතිවරන ක්‍රමය තුල, ඩිමොක්‍රටික් හා රිපබ්ලිකන් වරුන්ට විරුද්ධ, වෙනත් පක්ෂවල ක්‍රියාකාරී සහභාගිත්වය අවම කර තිබේ. ඡන්ද පත්‍රිකාවට නම ඇතුලත් කිරීමේ නීති රෙගුලාසි සකස්කර ඇත්තේ ද්වි පක්ෂ ඒකාධිපතිත්වයට අභියෝග කිරීම වැලැක්වීම සඳහා ය. එසේ ම ප්‍රධාන මාධ්‍ය ජාලයන් බලගතු සංගත අවශ්‍යතාවන් වෙනුවෙන් පාලනය කරන තතු තුල, මාධ්‍ය නිදහසට ඇත්තේ ද සොච්චම් නිදහසකි. තවද, විකල්ප අදහස්වලට සවන්දීමේ හැකියාව නිර්මානය කල අන්තර් ජාලය ද එන්ට එන්ට ම දැඩිවන නීති රෙගුලාසි වලට යටත් කරන බවට බොහෝ ඇඟවුම් ඇත.

## කම්කරු බලය සඳහා සටන

17. ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීම, සමාජවාදය සඳහා අරගලය සමඟ නොවෙන් කල හැකි පරිදි බැඳී තිබේ. ප්‍රජාතන්ත්‍රවාදයෙන් තොර සමාජවාදයක් නැතුවා සේම සමාජවාදයෙන් තොර ප්‍රජාතන්ත්‍රවාදයක් ද නොපවතිනු ඇත. ආර්ථික සමානතාවයකින් තොරව දේශපාලන සමානතාවයකට ද ඉඩක් නැත. යුද්ධයට එරෙහි අරගලයේ දී මෙන් ම ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කර පුලුල් කිරීමේ සටනට ද, රාජ්‍ය බලය අල්ලා ගැනීමේ සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන මෙහෙයවීම අවශ්‍ය කෙරේ.

18. කම්කරු බලය පිහිටුවීම සඳහා ධනේශ්වර රාජ්‍යයේ පවත්නා ආයතනවලට, සමාජවාදී අපේක්ෂකයන් තෝරා පත්කර ගැනීමට වඩා, බොහෝ දේ අවශ්‍යය. විප්ලවවාදී මහජන අරගල පැන නැඟීමේ තතු තුල, ජනගහනයෙන් කම්කරු පන්තියේ නියෝජිතයන් බහුතරයක් ඇතුලත් වන, අව්‍යාජ සහභාගිත්වයකින් යුත් නව ප්‍රජාතන්ත්‍රීය අකෘතීන් හා ව්‍යුහයන්, කම්කරුවන්ගේ, කම්කරුවන් සඳහා හා කම්කරුවන් විසින් යන සංකල්පය, කම්කරු ආන්ඩුවක පදනම් ලෙස වර්ධනය කල යුතුය. ආර්ථික ජීවිතයේ සමාජවාදී පරිවර්තනයක් සඳහා අත්‍යවශ්‍යවූ එම පියවරයන් ගන්නා විට, කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්වය විශාල වශයෙන් පුලුල් කිරීම සඳහා දිරිගැන්වීම් හා ක්‍රියාකාරී ප්‍රචාරනයක් දීම ද, තීන්දු ගැනීමේ ක්‍රියාවලීන් මත පාලනය තබා ගැනීම ද, එවන් ආන්ඩුවක ප්‍රතිපත්තිය විය යුතුය. අධිරාජ්‍ය ජනාධිපති තනතුර, සීරුවෙන් තබා ඇති හමුදාව හා ජාතික-ආරක්ෂක සංස්ථාව වැනි මහජනතාවට එරෙහි කුමන්ත්‍රනයේ මධ්‍යස්ථාන ලෙස සේවය කරන හෝ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සීමාකරන, පවත්නා ආයතන අහෝසි කිරීම වෙනුවෙන් එය පෙනී සිටිය යුතුය. ප්‍රගාඪ ලෙස ම ප්‍රජාතන්ත්‍රීය ස්වභාවයක් ගන්නා මේ සියලු අත්‍යවශ්‍ය වෙනස්කම් ජනතාව විසින් ම තීන්දු කල යුතුය. එය කල හැක්කේ සමාජවාදී විඥානයෙන් පුබුදු කල කම්කරු පන්තියේ මහා පරිමාන රැලිවීමකින් පමනි.

## කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය

19. බලය සඳහා අරගලයේ දී, ධනපති පන්තියේ පක්ෂ, දේශපාලන නියෝජිතයන් හා ඒජන්තයන් ගෙන් කොන්දේසි විරහිත දේශපාලන ස්වාධීනත්වයක්

කම්කරු පන්තියට අවශ්‍ය කෙරේ. අනෙකුත් පන්තිවල අවශ්‍යතාවන් සඳහා දේශපාලනිකව පෙනී සිටින්නවුන් සමග දුබල දේශපාලන සම්මුතීන් මගින්, සිය දෑත් බැඳ දමා ඇති තාක් දුරට කම්කරු පන්තියට, සමාජවාදී වැඩ පිළිවෙලක් ක්‍රියාවට නැගීම කෙසේ වෙතත්, බලයට පැමිනීම ගැන පවා සිතිය නොහැකිය. පලමුව හා සියල්ලටමත් වඩා මෙහි තේරුම වන්නේ, රිපබ්ලිකානු පක්ෂය හා සසඳන විට ඩිමොක්‍රටික් පක්ෂය "අඩු නපුර" නියෝජනය කරන්නේය යන යල් පිනූ හා ප්‍රෝඩාකාරී මිත්‍යාව ඉවත දැමීමයි. මෙය වනාහි, එක්සත් ජනපදයේ කම්කරු ව්‍යාපාරයට බරවා කකුලක් බවට පත්ව තිබෙන, පූර්ව සිවිල් යුද්ධ අවධියේ වහල් හිමි පන්තියෙහි සිය පෙකනි වැල පිහිටා තිබෙන, මෙම ප්‍රතිගාමී ධනේශ්වර පක්ෂයට කම්කරු පන්තිය යටත් කර තැබීමකි. කම්කරු ව්‍යාපාරයෙහි කාර්මික සටන්කාමීත්වයේ හා ප්‍රචන්ඩ පන්ති ගැටුමේ සම්ප්‍රදාය තිබිය දී ම, වෘත්තිය සමිති නිලධරය, කොමියුනිස්ට් පක්ෂයේ ස්ටැලින්වාදීන් හා නිමක් නැති මධ්‍යම පන්තික ප්‍රවනතාවන් විසින් වගා දිගා කල, ඩිමොක්‍රටික් පක්ෂය මත කම්කරු පන්තියේ රඳ පැවැත්ම, තමන්ගේ ම ධජය යටතේ ස්වාධීන පන්ති ක්‍රියාමාර්ගයක් සඳහා සටන් වදින එහි දේශපාලනිකව සවිඥානක ව්‍යාපාරයක් වර්ධනය කිරීමට බාධාකාරී විය. සමාජවාදී සමානතා පක්ෂයේ පරම දේශපාලන වගකීම් අතර අංක එකෙහි ඇත්තේ කම්කරු පන්තිය ඩිමොක්‍රටික් පක්ෂයෙන් හා සමස්ත ද්වි පක්ෂ ක්‍රමයෙන්ම තීරනාත්මකව බිඳී වෙන්වීම සඳහා දිරිමත් කිරීම, උදව් කිරීම හා මග පෙන්වීමයි.

20. කෙසේ වුව ද සසප, ඩිමොක්‍රටික් හා රිපබ්ලිකන් පක්ෂ කෙරෙහි දක්වන විරුද්ධත්වයෙන්, මෙම සංස්ථාපිත පක්ෂ දෙකට එරෙහිව මතුවිය හැකි ඕනෑම දේශපාලන විරුද්ධත්වයකට, ක්‍රියාමාර්ගය ගැන නොසලකා සහාය දැක්වීමට බැඳීමක් ඇතැයි අදහස් නොවේ. කම්කරු පන්තික අවශ්‍යතාවයේ දෘෂ්ටි ආස්ථානයේ සිට ඩිමොක්‍රටික් හා රිපබ්ලිකන් පක්ෂවලට අව්‍යාජ දේශපාලනික හා ක්‍රියාමාර්ගික විකල්පයක් ඉදිරිපත් නොකර, ද්වි පක්ෂ ක්‍රමය කෙරෙහි පවත්නා ජනතා අසංතෘෂ්ටියට ආයාචනය කරන තුන්වන "විරෝධතා" පක්ෂ පිලිබඳ දිගු ඉතිහාසයක් එක්සත් ජනපදය සතුව ඇත. මෑත වසරවල සැලකිය යුතු සහයෝගයක් දිනාගත් රොස් පෙරෝගේ ප්‍රතිසංස්කරන පක්ෂ ව්‍යාපාරය, ධනේශ්වරයට සෑහෙන මූල්‍ය හා මාධ්‍ය අවධානය ලබාදුන හොත්, මහජන අතෘප්තිය ගසාකෑම මගින් එය දේශපාලනිකව නිෂ්ක්‍රීය කල හැක්කේ කෙසේද යන්න පිලිබඳ නිදසුනකි. ජාතික මැතිවරන ගනනාවකටත් බොහෝ රාජ්‍ය හා පලාත් මැතිවරනවලටත් තරග කර ඇති හරිත පක්ෂය සම්බන්ධයෙන් කිව හොත්, එය මධ්‍යම පන්තිය වෙනුවෙන්, පවත්නා සමාජයේ සීමිත ප්‍රතිසංස්කරන, මූලිකව ම පරිසර ක්ෂේත්‍රයේ ප්‍රශ්න වෙනුවෙන් පෙනී සිටින පක්ෂයකි. එහි බොහෝ දේශපාලන ක්‍රියාකාරීන් වැඩ කරන්නේ ඩිමොක්‍රටික් පක්ෂය තුල හෝ එය වටාය. එක්සත් ජනපදයේ දේශසීමාවෙන් පිටත වෙනත් රටවල දී හරිත දේශපාලඥයන් ධනේශ්වර ආන්ඩු ඇතුලත කටයුතු කරන අතර ධනේශ්වර රාජ්‍යයට මහඟු සේවයක් ලබා දෙයි.

21. දේශපාලන ප්‍රවනතාවන් තක්සේරු කිරීමේ දී සසප සැලකිල්ලට ගන්නා තීරනාත්මක මිනුම් දන්ඩ, එක් හෝ තවත් ප්‍රශ්නයක් පිලිබඳව ඔවුන්ගේ සිද්ධිමය ආස්ථානය නොව, ඔවුන්ගේ ඉතිහාසය, ක්‍රියාමාර්ගය, ඉදිරිදර්ශනය හා දිශානතියේ පන්ති පදනමයි. ඡන්දයෙන් තාවකාලික වාසි අත්කර ගැනීමේ නාමයෙන් මැතිවරන සන්ධාන ගොඩනැගීම හරහා, කම්කරු පන්තිය දේශපාලන අන්ධ පථයකට දැක්කූ නිමක් නැති උදාහරන ඉතිහාසයෙන් අපට සපයා තිබේ. ඒ සඳහා කම්කරුවන් ඔවුන්ගේ වඩාත්ම වැදගත් දේශපාලන, සමාජ හා ආර්ථික අවශ්‍යතාවන් කැපකල යුතු විය. 1930 ගනන්වල ස්ටැලින්වාදී හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ විසින් ගොඩනගන ලද "මහජන පෙරමුනු" සන්ධාන තුලින්, පුලුල් පදනමක බහු පන්තික හා ඒ නිසා ම එකිනෙකට පටහැනි සමාජ අවශ්‍යතාවන්ගේ බෙලහීන සහාගයන් ගොඩනැගීම සඳහා, ඓතිහාසික හා දිගු කාලීන අවශ්‍යතාවන් අදූරදර්ශී හා නින්දිත ලෙස කැපකිරීමේ ප්‍රතිවිපාක පිලිබඳ අතිශය ඛේදජනක නිදසුන් සපයා තිබේ.

**මතු සම්බන්ධයි**

© www.wsws.org